2011.06.27

සමෘද්ධි චක්‍රලේඛ අංක 02/2011

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

සහකාර සමෘද්ධි කොමසාරිස් / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය ලේකම් / ප්‍රාදේශීය නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,

දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී,

සමෘද්ධි කළමණාකරු,

සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත .

**" දිවි නැගුම " ජාතික ව්‍යාපාරයට සමගාමීව ක්‍රියාත්මක කෙරෙන**

**ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2011**

2011 වර්ෂයට අදාල ඉදිරි වැඩ සැලැස්ම මත, දිවිනැගුම වැඩසටහනට සමගාමීව වසම්, කලාප, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාපෘති ආරම්භ කළ යුතු අතර මෙම වැඩසටහන පහත සඳහන් අයුරින් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත.

- ගෙවතු වගා දශලක්ෂය පාදක කොට ගෙන,
  - * ආරක්ෂිත ගෘහ තුළ පැල තවාන් ඇති කිරීම.
  - * අනෙකුත් පැල තවාන් ඇති කිරීම.
- ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට අදාලව,
  - * කෘෂි, සත්ත්ව පාලන හා ධීවර, කර්මාන්ත, අලෙවි හා සේවා වශයෙන් ව්‍යාපෘති ආරම්භ කිරීම.
  - * විශේෂ ව්‍යාපෘති ආරම්භ කිරීම. - ප්‍රාදේශීය අවශ්‍යතාවයන් අනුව ලැබෙන ක්ෂේත්‍ර ඉල්ලීම් මත,

දිවිනැගුම වැඩසටහනට සම්බන්ධව අංක SP/SB/02/11 හා 2011.02.07 දිනැති ජනාධිපති ලේකම් තුමාගේ හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2011.03.14 හා චක්‍රලේඛ අංක 01/2011 මඟින් හා පැල තවාන් ආරම්භ කිරීම සම්බන්ධයෙන් මගේ අංක ස/අධි/07/2/ දිවිනැගුම හා 2011.04.20 දාතමැති ලිපියෙන් අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් දැනටමත් ලබා දී ඇත.

01. පැල තවාන් සඳහා ප්‍රතිලාභීන් හඳුනා ගැනීම.

- ආරක්ෂිත ගෘහ තුල එළවළු හා පලතුරු භෝග , අපනයන කෘෂි භෝග, ඖෂධ පැල, බහු වාර්ෂික භෝග සහ විසිතුරු මල් වර්ග ආදිය වගා කල හැක. ආරක්ෂිත ගෘහ තුල වගා කිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ, දෙවන ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය (ගැමි දිරිය) හා අධ්‍යක්ෂ, යලි පුබුදමු ව්‍යාපෘතිය වෙත හරිතාගාර තුල පැල තවාන් ඇති කිරීමේ වැඩසටහන මැයෙන් දිස්ත්‍රික් ලේකම්ටද පිටපතක් සහිතව එවන ලද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ

අංක MED/RE/A.sec/01/11 හා 2011.06.11 දිනැති ලිපිය ගැනද සැලකිලිමත් වී දිවිනැගුම වැඩසටහනට සම්බන්ධ සෑම වසමකටම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවකාශ ඇත.

- ඔබ දිස්ත්‍රික්කයෙන් අප වෙත යොමු කර තිබෙන දැනට ආරම්භ කර ඇති හා යෝජිත තවාන් කරුවන්ගේ නාම ලේඛණය හ ා කෘෂිකර්ම, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අනෙකුත් ලියාපදිංචි පැල තවාන්කරුවන් පිළිබඳව අවධානය යොමු කොට අතිරික්ත නිෂ්පාදනයක් ඇති නොවන පරිදි ප්‍රදේශයේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි තවාන් ස්ථාපිත කල යුතුය.
- මෙම ව්‍යාපෘතිය සඳහා උනන්දුවක් දක්වන, හැකියාවක් තිබෙන, ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත ගෙවත්තක් ඇති ප්‍රතිලාභියෙකු සම්බන්ධ කර ගැනීම තුලින් ඉලක්ක සාධනීය කර ගත හැකි අතර අදාල තෝරා ගැනීම් සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ එකඟතාවය ලබාගත යුතුය.

02. ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට අදාලව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා ජීවනෝපාය සංවර්ධන අංශයේ 2009.12.15 දිනැති සමෘද්ධි චක්‍ර ලේඛ අංක 2010/01 කෙරෙහි අවධානය යොමු කරන අතර අතිරේකව අනුගමනය කළ යුතු නිර්ණායක පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

- ව්‍යාපෘතිය කෙරෙහි උනන්දුවක් දක්වන ඕනෑම සමෘද්ධි ලාභියෙකු හෝ අඩු ආදායම් ලාභියෙකු විය හැකිය. දැනට විශ්වාසය තහවුරු කර ඇති ව්‍යාපෘතියක් කරන අයෙකු වීම වඩාත් සුදුසු වේ.
- ව්‍යාපෘති ආරම්භයේදී ප්‍රතිලාභියා සමඟ ගිවිසුම් ගත වීම අනිවාර්ය වේ.
- මෙය කිසිසේත්ම භාණ්ඩ බෙදා හැරීමේ ව්‍යාපෘතියක් නොවිය යුතු අතර සෑම යෝජනාවක් සඳහාම මේ සමඟ ලබා දෙන ආකෘතිය ප්‍රකාර විධිමත්ව සකස් කළ ව්‍යාපෘති වාර්තාවක් ප්‍රාදේශීය ලේකම් / නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ හා දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ගේ නිර්දේශයන් සහිතව පිළියෙල කර අනුමැතිය පිණිස ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ - ජීවනෝපාය සංවර්ධන වෙත ඉදිරිපත් කළ යුතුය.

03. ප්‍රතිපාදන නිදහස් කිරීම.

3.1ආරක්ෂිත ගෘහ තුළ පැල තවාන් ඇති කිරීම සඳහා -

- වර්ග අඩි 510 ක ආරක්ෂිත දැල් ගෘහයක් සඳහා පහත දක්වා ඇති ඇස්තමේන්තුව පරිදි ප්‍රතිපාදන ලබා දිය හැක.

| | |
|---|---|
| ආරක්ෂිත ගෘහ ඉදිකිරීම සඳහා | = රු 148,500.00 |
| උපකරණ සඳහා | = රු 9,650.00 |
| රෝපණ ද්‍රව්‍ය හා යෙදවුම් සඳහා | = රු 10,000.00 |
| එකතුව | = රු 168,150.00 |

- ඉහත ඇස්තමේන්තුව ප්‍රකාර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සකස් කර ඉදිරිපත් කර ඇති සැලැස්මේ ආදර්ශ ආකෘතිය හා ඇස්තමේන්තුව ඇමුණුම් 1 ලෙස මේ සමඟ එවා ඇත.
- අවශ්‍යතාවය මත ඇස්තමේන්තු මුදලින් 50% ක් එනම් රු 84,000.00 ක ප්‍රදානයක් ලෙස ලබා දිය හැකි අතර ඉතිරි 50% ප්‍රතිලාභියා විසින් දැරිය යුතු වේ.
- ප්‍රතිලාභියා විසින් දැරිය යුතු 50% මුදල සඳහා සමෘද්ධි බැංකුව හෝ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව මඟින් ණය මුදලක් ලබා ගත හැකි අතර ව්‍යාපෘති වාර්තාව හා ගිවිස්නාව සඳහා මේ සමග හඳුන්වා දෙන ආදර්ශ ආකෘති, ඇමුණුම් 2.1 හා 2.2 යොදාගත යුතුය.

3.2 වෙනත් පැල තවාන් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට අදාළව,

එක් ව්‍යාපෘතියකට රු.40,000ක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන නිදහස් කරනු ලබන අතර 5%ක පොලී ප්‍රතිශතයක් මත වාරික 10ක් හෝ 15ක් අතර ප්‍රමාණයකින් මුළු මුදලම ආපසු අය කර ගත යුතුය. සහන කාලය මාස 02කි. ව්‍යාපෘති වාර්තාව අනුව ප්‍රතිපාදන ඉල්ලුම් කල යුතු අතර ඊට අදාල ගිවිස්නාව අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතුය.එය ඇමුණුම් අංක 3 ලෙස මේ සමඟ එවමි.

04. පරිපාලන වියදම්

පරිපාලන වියදම් සඳහා 2%ක් ඒ ඒ ව්‍යාපෘති සඳහා වෙන් කරනු ලබන මුදලින් ලබා ගත හැකි අතර, ඉන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා 0.5%ක් ද 1.5% ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහාද විය යුතුය. වැඩසටහන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, සමෘද්ධි සහකාර කොමසාරිස්/දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රාදේශිය ලේකම්/ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ, එම කාර්යාල වල ගණකාධිකාරිවරුන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිළධාරීන් සහ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සියළුම නිලධාරීන් මේ සම්බන්ධව ඉටු කරන රාජකාරී කටයුතු සඳහා දරනු ලබන ගමන් වියදම් හා ඉන්ධන වියදම් ද, සමෘද්ධි කාර්යාලයන්හි අතිරේක ලිපි ද්‍රව්‍ය හා ඉන්ධන ගාස්තු වශයෙන් වැයවන මුදල්ද, පූරප්පාඩු වූ තනතුරු වල රාජකාරී ඉටුකරන සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරීන්ගේ ගමන් වියදම් ඇතුළු වෙනත් පුනරාවර්තන වියදම් ද මෙම පරිපාලන වියදම් තුලින් දැරීමට උපදෙස් දෙනු ලැබේ.

05. භාණ්ඩාගාර ප්‍රතිපාදන හා චක්‍රීය අරමුදලින් ආරම්භ කරනු ලබන සියළුම ව්‍යාපෘති සම්බන්ධව ,

- සතිපතා,
- මාසිකව,


කලාප, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී විශේෂ සමාලෝචනයක් කළ යුතු අතර ජාතික මට්ටමින් මාසිකව මෙහි ප්‍රගතිය අධිකාරියේදී සාකච්ඡා කෙරේ.

06. දිවිනැගුම වැඩසටහන සාර්ථක කර ගැනීමට ව්‍යාපෘති හඳුනාගෙන පුද්ගලිකව හෝ කණ්ඩායම් ලෙස මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ගෘහස්ථ ආර්ථික ඒකක ලෙස ශක්තිමත් කර, සමස්ථ ආර්ථික සංවර්ධනය සඳහාත් දායක වීමට සමෘද්ධි වැඩසටහනට හැකියාව ලැබෙනු ඇත.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ ඇතුළු කාර්යමණ්ඩලයෙන් ලැබෙන
සුවිශේෂී සහාය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල් .

| | | | |
|---|---|---|---|
| පිටපත් - | 01. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.පි. |
| | 02. අතිරේක ලේකම්,(ග්‍රාමීය ආර්ථික)ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.පි. |
| | 03. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | - | අ.ක.ස. |
| | 04. . සියළුම අංශ ප්‍රධානීන් හා ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | අ.ක.ස. |


Proposed estimate for Construction of Poly - Net Arch Shape
Diffused Poly Film +
60% Black Shade Net
Open
½" Ø 2mm
60% Black Shade Net
Continous Cement
Brick Layer
Continous Cement
Brick Layer
6654mm
(14'-00")
9000mm (30'-00")
600mm
(2'-00")
900mm
(3'-00")
2400mm
(8'-00")
Door
5100mm
(17'-00")
½" Ø 2mm
1800mm
600mm (2'-00")
1800mm (6'-00")
2400mm (8'-00")
Ø 2mm

## Proposed Estimate for Construction of Poly – Net Arch Shape

| Item No | Description | QTY | Unit | Rate Rs. | Total Rs. |
|---|---|---|---|---|---|
| 1 | GI DOUBLE SIDE 1" 2MM PAKISTAN (APPROX.5.8 M PER LENGTH) | 9 | LEGNTH | 1880.00 | 16740.00 |
| 2 | GI DOUBLE SIDE ½" 2MM PAKISTAN | 26 | LEGNTH | 1100.00 | 28600.00 |
| 3 | POLY FILM – 200 MICRON | 65 | SQ.M | 300.00 | 19500.00 |
| 4 | SHADE NETTING - 60% | 116 | SQ.M | 135.00 | 15660.00 |
| 5 | 1 ¼" GI 2MM PAKISTAN | 1 | LEGNTH | 2740.00 | 2740.00 |
| 6 | CONCRETE POST 1'×1'×1' | 18 | NOS. | 1250.00 | 22500.00 |
| 7 | FABRICATION OF THE GI STRUCTURE | | | | 12000.00 |
| 8 | OTHER MISC. ITEMS – CLIPS, UV YARN | | | | 3260.00 |
| 9 | TRANSPORTATION | | | | 3500.00 |
| 10 | INSTALLATION – ENCLUDING WELDING | | | | 16500.00 |
| 11 | OTHER CIVIL WORK – BRICK WORK ETC | | | | 5000.00 |
| 12 | MISC. EXPENDITURE | | | | 2500.00 |
| | TOTAL | | | | 148,500.00 |